(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 381.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2627/'12

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙන් කරන ලද මුදල් ඒ ඒ වර්ෂ සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3240/'12

2\.

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/'12

3\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම ''සේවා පියස'' කාර්යාලය බැගින් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) ''සේවා පියස'' එක් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iv) ''සේවා පියස'' පළමු කාර්යාලය ඉදිකරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3447/'13

4\.

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා සපුරා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) උතුරු මැද පළාතේ එක් එක් අධ්‍යාපන කලාපයේ සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් සුදුසුකම් නොමැතිව සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ සේවය කරන අධ්‍යාපන කලාප කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ දැනට සේවය කරන ස්ථාන කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා සුදුසුකම් නොමැතිව එම පළාතේ සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ සේවය කරන අධ්‍යාපන කලාප කවරේද;

(v) ඉහත තනතුර සඳහා සුදුසුකම් නොමැති පුද්ගලයින් පත්කිරීමේ පදනම කවරේද;

(vi) සුදුසුකම් නොමැති පුද්ගලයන් විසින් තමාට හිමි නැති තනතුරකට ඉහත පරිදි පත්වී අයථා ලෙස දීමනා ලබා ගෙන ඇත්නම්, එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3651/'13

5\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3688/'13

6\.

ගරු අනුර දිසානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 සහ 2012 වර්ෂ දෙකම සඳහා පැවැත්වූයේ එක් රාජ්‍ය නාට්‍ය උළෙලක් බවත්;

(ii) වාර්ෂිකව පැවැත්විය යුතු එම උළෙල ඉහත සඳහන් පරිදි වර්ෂ දෙකකට වරක් පැවැත්වීමට හේතුව මුදල් නොමැතිකම බවත්;

යන්න එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අනුග්‍රහය මත නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවැත්වූ "මහ සමයම" ප්‍රසංගයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලැබුණු ආකාරය කවරේද;

(iii) එම ප්‍රසංගයේ එක් එක් කටයුතු වෙනුවෙන් එම මුදල් වියදම් කළ ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4433/'13

7.

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉන්දීය ආරක්ෂක අමාත්‍යවරයා විසින් ලොක් සභාවේදී සිදුකර ඇති ප්‍රකාශයකට අනුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවෙන් අවි මිලදී ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම අවි ගනුදෙනුව සිදු කර ඇති දින වකවානු කවරේද;

(iii) ඉන්දියාව විසින් එසේ මිලදී ගනු ලැබ ඇති ආයුධ වර්ග කවරේද;

(iv) එම ආයුධ අලෙවි කිරීම මගින් ශ්‍රී ලංකාව ලැබූ ආදායම කොපමණද;

(v) එම ගනුදෙනුවල විනිවිදභාවය තහවුරු කෙරෙන වාර්තාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4505/'13

8.

ගරු සුජීව සේනසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව (CHOGM) සඳහා සහභාගී වූ රාජ්‍ය නායකයින් හා අමුත්තන් වෙනුවෙන් වෙන් කර තිබූ සංචාරක හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iii) එකී සමුළුවට සහභාගී වූ අමුත්තන් වෙනුවෙන් ආහාර සැපයීම සිදු කළ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4521/'13

9.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දික්ඕවිට ධීවර වරාය කේන්ද්‍ර කර ගනිමින් ශ්‍රී ලංකාවට ආසන්නව ජාත්‍යන්තර මුහුදේ මසුන් මැරීමට ශ්‍රී ලංකා රජය විසින් විදේශ සමාගම් සඳහා අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එකී අවසරය මත මේ වන විට එම මුහුදු ප්‍රදේශයේ මසුන් මැරීමේ යෙදී සිටින සමාගම් සහ එම සමාගම් අයත් රටවල් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට අදාළව එම සමාගම් විසින් පිළිපැදිය යුතු නීති රීති මාලාවන් හඳුන්වා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4588/'13

10.
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුදු බදු සහ අනෙකුත් ආශ්‍රිත බදු ගෙවීම පිණිස "මරීනා කලම්බු" හෝ වෙනත් සමාන නමකින් "කැසිනෝ" ආයතනයක් ලියාපදිංචි කොට තිබේද;

(ii) එම ආයතනය පළමු වරට ලියාපදිංචි කොට තිබෙන්නේ කවදාද;

(iii) ඉහත කී කැසිනෝ ආයතනය ලියාපදිංචි කොට තිබෙන්නේ කවර නාමයක් (පුද්ගලයකු හෝ සමාගමක්) යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4714/'14

11.
ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර, කුළුගම්මන, අංක 122 දරන ස්ථානයේ පදිංචි එන්. පී. එම්. තව්ෆීර් මහතා, වත්තේගම අධ්‍යාපන කලාපයට අයත්, මහ/ව/අල්හික්මා මුස්ලිම් මහ විද්‍යාලේ නියෝජ්‍ය විදුහල්පති (විදුහල්පති සේවයේ II ශ්‍රේණිය) ධුරය දරමින් සිටියදී, සේවයෙන් විශ්‍රාම යෑම පිණිස 2008.03.01 දින ලිඛිත ඉල්ලීමක් භාර දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2011.05.30 වැනි දිනට වයස අවුරුදු 60 ක් සම්පූර්ණ කරන ලද තව්ෆීර් මහතා විශ්‍රාම ගැන්වීම ප්‍රමාද කිරීමේ හේතු කවරේද;

(ii) මුල් පත්වීම ලද 1971.10.03 වැනි දිනයේ සිට දශක තුනක කාලයක් සතුටුදායකව ඉටු කරන ලද සේවය සැලකිල්ලට ගෙන ඒ මහතා විශ්‍රාම ගැන්වීමට නොපමාව පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4741/'14

12.
ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ඇති පාසල් අතරින් 6 වැනි ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සෞන්දර්යය විෂයයන් උගන්වනු ලබන පාසල් කවරේද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති එවැනි පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල සේවයේ නියුතු සංගීත, නැටුම්, චිත්‍ර හා නාට්‍ය හා රංග කලාව යන සෞන්දර්යය විෂයයන් උගන්වනු ලබන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම දිස්ත්‍රික්කයේ ඇති සෞන්දර්යය ගුරු අවශ්‍යතාව ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4797/'14

13.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා 1994 වර්ෂයේදී පැවති විවෘත තරග විභාගයේ දී ලබා ගත් ලකුණු මත පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයකට කැඳවන ලද අපේක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් සිදු කරන ලද කඩඉම් ලකුණ (Cut - off mark) කොපමණද;

(iii) විභාග අංක 01381 යටතේ එකී විභාගයට පෙනී සිට, ලකුණු 850න් 421ක් ලබා ගත් ගල්ගමුව, මහගල කන්ද විල, මැදගම, අංක 36 හි පදිංචි එල්. ඒ. නිමල් යන අයව සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවීමට හේතු කවරේද;

(iv) සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීම හේතුවෙන් එල්. ඒ. නිමල් යන අයට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, එල්. ඒ. නිමල් මහතාට ලබා දිය හැකි සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4818/'14

14.

ගරු තිස්ස අත්තනායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාල ආසනයේ පවුල් 300ක් සහ පාසල් සිසුන් 500ක් පමණ භාවිතා කරන ගල්ඒදණ්ඩ, වළල දක්වා දිවෙන කිලෝමීටර 2 ක් පමණ වූ මාර්ගය වාහන ධාවනය කළ නොහැකි මට්ටමකට දැඩි ලෙස අබලන් වී සහ සෝදාපාළුවට ලක් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය කඩිනමින් පිළිසකර කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4842/'14

15.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කණ්ඩවාලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ධර්මපුරම් ගම්මානයේ තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බවත්;

(ii) 1958 වර්ෂයේ සිට මේ දක්වා ධර්මපුරම් ගම්මානය සහ අවට ප්‍රදේශයේ ජනතාව තම තැපැල් සේවාවන් ඉටු කර ගැනීම සඳහා පෞද්ගලික නිවෙස්වල සිට ක්‍රියාත්මක වූ ධර්මපුරම් තැපැල් කාර්යාලය භාවිතා කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ධර්මපුරම් තැපැල් කාර්යාලයට ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන

ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**